WWW.OLEVELAPI.COM



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 S**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

# සිංහල සාහිත්‍ය රසාස්වාදය
இலக்கிய நயம் சிங்களம்
Appreciation of Sinhala Literary Texts

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

※ I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකකටත්** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** ලියන්න.

(i) "අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කූඩුවක් හදමු"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

(ii) "මෑ සත් කඩක් කොට කපා රජ දරුවන් සත් දෙනාට දී පියා ගැලවෙමිව"
(අ) මෙහි "මෑ" යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරෙක් විසින් ද?

(iii) "ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්,
'ඔබ'ට අන් කිසිවෙක් නිසි නෑ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්"
(අ) 'විදුලියත් පැහැ පත් රන දම් සෙයින්' යන පද්‍ය ඛණ්ඩයෙහි අර්ථය ලියන්න.
(ආ) මෙම කවිය ඇතුළත් පද්‍ය නිර්මාණයේ කතුවරයා කවුද?

(iv) "එසේ වී නම් දෙවඟනන් ලබන නියාවට මෙතරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

(v) "... පුතාට ඕව දැන්ම බෑ. ඇඟිල්ල කැපෙයි. බලාගෙන ඉඳලා ඉගෙන ගන්ඩ"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද? (ලකුණු 04 × 5 = 20 යි.)

**2.** පහත දී ඇති පැදි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

විච්චි චිරි විච්චි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නො කැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොලන
පාර තොට, ගහ කොළ ද, වසා ගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුන
අලුත් පස් ඇමු පාර දනිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරිව

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

තෙමුණ රෙදි ඇඟ ඇලුණ හබුරු කොළ මලිපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැදුණ
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වැහි තද හුළඟ නො පායන මුළු දවස

ඔළුව කෙස් තෙත බරිව පිට දිගේ වැක්කෙරෙන
කාර් රෝදෙන් විරිස් ඇඟ පුරා මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහොතකින් ඉවර කොට
තුවායෙන් ඇඟ පත ද පිහ දමා හිස කෙස් ද
අලුත් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇඟෙහි ඉඳ උණුහුමට බොන්නෙ කොයි මොහොතෙදැයි
වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ළත වේ ය

(i) මෙම පද්‍ය පන්තියට පාදක වූ අද්දැකීම පැහැදිලි කරන්න.

(ii) මෙම අද්දැකීම රසවත් ලෙස ඉදිරිපත් කිරීම සඳහා කවියා තෝරා ගත් අවස්ථා හා සිද්ධි කවරේදැයි විස්තර කරන්න.

(iii) කවියා වැස්ස කෙරෙහි කුමන ආකල්පයක් දරන්නේදැයි පැහැදිලි කරන්න.

(iv) මෙම පද්‍ය පන්තියේ සාර්ථකත්වය සඳහා කවියා යොදා ගත් භාෂාව ඉවහල් වී ඇති ආකාරය විමර්ශනයට ලක් කරන්න.

(v) ''කවියා යොදාගත් ආකෘතිය පද්‍ය පන්තියේ සාර්ථක බව සඳහා හේතු වී තිබේ ද?'' විමසන්න.

(ලකුණු 25 යි.)

## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

**3.** නන්ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් 'පාත්‍රය හැර ගත මැනව'යි නො කියා රජ ගෙන් වඩනා ගමන හෙයින් හිණි හිස කෙරෙහි දී හැරගන්නා සේකැ යි සිතුහ. බුදුහු එතන දීත් පාත්‍රය හැර නොගත් සේක් හිණි පා මුල දී හැර ගන්නා සේක් වනැ යි සිතා යන කලට එතන දීත් හැර නො ගන්නා රඳනු කැමැති වත් අභිප්‍රායකින් ම නොව බුදුන් කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනව යි කියා ගත නොහී මෙතන දී හැර ගන්නා සේක. මෙතන දී හැර ගන්නා සේක් වනැ යි සිතා ම නො සිතින් ගියත් සිතින් ම සසර ගමනින් නවත්නා හෙයින් යෙත් ම ය.

ඒ වේලෙහි නන්ද කුමරුවන්ගේ දනවු කලණ නම් වූ කුමාරයන්ට සරණ නිල වූ මුල් නැ කම කවරේ වුවත් රජ කම් හෙයින් බැදෑණියන් ළඟට මිනිස්සු ගොසින් බුදුහු පිය රජ්ජුරුවන්ගේ මාළිගාවට වැඩි ගමනේ මුඹදැගෙන් වෙන් කොට නන්ද කුමරුන් වහන්සේ කැඳවා ගෙන වඩනා සේකැ යි කිවු ය. එ බස් අසමින් ඕ ද හිස සෝධමින් සිටි තැනැත්තෝ සෝධා නො නිමි හිස කේ නො බැඳ, වහා අවුත් 'ගියත් සුළු ගෙයි, වහා එව' යි කිවු ය. උන් කියා ලූ බස නන්ද කුමරුන් සිත දිවුල් ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ තරයේ ම වැද ගත. බුදුනුත් පාත්‍රය අතින් නොගෙන වෙහෙරට ගෙන ගොසින් නන්ද කුමරුනි, මහණ වවු දැ'යි වදාළ සේක.

බුදුන් වදාළ බස මඟුලෙන් හෙළා ලූ කප උඟුළුවන්ට බැරියා සේ උඟුළුවා ලන්ට බැරි හෙයින් 'මහණ නො වෙමි'යි නො කියා 'යහපත මහණ වෙමි' කියා ගිවිස්සාහ.

(i) මෙම ඡේදයෙහි ඇතුළත් උපමා **දෙකක්** උපුටා දක්වන්න. (ලකුණු 05 යි.)

(ii) නන්ද කුමරු බුදුන් වහන්සේ පසුපස ගියේ කුමක් සඳහා ද? (ලකුණු 05 යි.)

(iii) 'ගියත් සුළු ගෙයි, වහා එව'යි ජනපද කල්‍යාණිය පැවසීමට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) සද්ධර්මරත්නාවලියේ කතුවරයා නාට්‍යාකාරයෙන් සිද්ධි නිරූපණය කර ඇති ආකාරය ඉහත ඡේදය ඇසුරෙන් විමසන්න. (ලකුණු 10 යි.)

(ලකුණු 25 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



**නැතහොත්**

රිදියෙන් තනලා රත්රන් ඔබලා කැරලි කෙටුවයි   දැකැත්තේ
සුරතට රන්වන් රැලි නංවා ලා කදිමට දිලිසෙයි   දැකැත්තේ
අඩියෙන් අඩියට තාල කියන්නට සබයෙන් අවසර   ලැබගත්තේ
සතරවරම් දෙවියන්ගේ බලයෙන් ගොයම් කපමු අපි   දැකැත්තේ

ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර   වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ   වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟේ දියවර   වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් තෙළන මේ කෙත   වාගේ

ලස්සන හිමවතේ මා වී   පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා   හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත්   බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල්   රකින්නේ

කන්ද උඩින් එන කිකිළිය   ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු   කැටියේ
අත පාමුදු පය පාමුදු   වයිරොඩියේ
මට පිටුපා ගෙට යනවද   සුරතලියේ

බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ   ගෙට
මැනලා වී දෙකක් දුන්නයි   මල්ලකට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි   මට
මැනල ද පුතේ කිරි දුන්නේ මං   නුඹට

දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්ඩ යන හැටි බලන්   කලූ
සේලේ ඇඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන් කරයි   කලූ
දහසක් දීලා වළලු තනාලා දෑතේ අතලා බලයි   කලූ
දුනුකේ මල සේ උළු ගෙයි ඇඳ පිට ඔළිඳ කෙළින සැටි බලන්   කලූ

(i) මෙම පද්‍ය මගින් නිරූපණය වන කෘෂිකර්මාන්තයේ අවස්ථා **දෙකක්** නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(ii) කවියා යොදා ගත් භාෂාවේ විශේෂතා **දෙකක්** නිදසුන් සහිත ව අගයන්න. (ලකුණු 05 යි.)

(iii) එදිනෙදා ජීවිතයේ කටුක අද්දැකීම් කවියා නිරූපණය කළ ආකාරය ඉහත කවිවලින් නිදසුන් **දෙකක්** සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) ''ගැමියා සහ පරිසරය අතර පැවති බැඳීම මෙම පද්‍ය මගින් නිරූපණය වේ.'' නිදසුන් **තුනක්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි.)

WWW.OLEVELAPI.COM

(ලකුණු 25 යි.)

## III කොටස

මෙම කොටසෙන් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.
(පිළිතුර වචන **150ට නො අඩු** විය යුතු ය.)

4. සංවේදී සිදුවීම් සියුම් ලෙස නිරූපණය කිරීමට, ඇත්ගාලේ දරු පෙම පද්‍ය පන්තියේ කතුවරයා දැක්වූ කුසලතාව නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

5. ජාතක කතා කතුවරයාගේ අවස්ථා නිරූපණ හැකියාව කුස ජාතකය ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** දෙමින් අගයන්න. (ලකුණු 15 යි.)

6. සුභාෂිතය කතුවරයා උපමා ඇසුරෙන් සදුපදේශ ලබා දීමට ගත් උත්සාහය නිදසුන් **තුනක්වත්** දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

7. ''සිරිසේන තම කලා හැකියාවන් පෝෂණය කර ගත්තේ අබිලිං මාමා ආදර්ශයට ගැනීමෙන් ය.'' තුංමංහංදිය නවකතාව ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

(ලකුණු $15 \times 2 = 30$ යි.)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....